# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 609/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 08/04/2024 පැය 1740

## මාධ්‍ය නිවේදනය

**වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් - ගම්පහ පොලිස් වසම.**

2024.04.08 වන අද දින සවස් කාලයේදී ගම්පහ පොලිස් වසමේ කටුගස්තර ප්‍රදේශයේ දී යතුරු පැදියකින් පැමිණි නාඳුනන පුද්ගලයන් දෙදෙනෙකු විසින් පුද්ගලයෙකුට වෙඩි තැබීමෙන් බරපතල තුවාල ලබා ගම්පහ රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට ගම්පහ පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත. වෙඩි තැබීමට සම්බන්ධ සැකකරුවන් සිද්ධියෙන් පසු පලා ගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 34 ක් වන කටුගස්තර, ගම්පහ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු තම නිවසේ රථ වාහන පින්තාරු කිරීමේ ගරාජයක් පවත්වාගෙන යනු ලබන අතර, ඔහු එම ස්ථානයේ සිටියදී මෙම වෙඩි තැබීම සිදුකර ඇති බවට අනාවරණය වී ඇත. සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා ගම්පහ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**